**ශ්‍රම වාසනා අරමුදල - 2014**
**----------------------------**

ශ්‍රම වාසනා අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනතේ 12(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**2.1 මතය**
**------**

මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර වත්කම්වලට අදාළව යන්ත්‍ර හා උපකරණ ක්ෂය අනුපාතය සියයට 10 සිට සියයට 20 දක්වාද, ලී බඩු හා සවිකිරීම් ක්ෂය අනුපාතය සියයට 7.5 සිට සියයට 10 දක්වාද සංශෝධනය කර තිබුණත් ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.41,800 ක් වටිනා පරිගණක හා උපාංග ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට පුනරාවර්තන වියදම් ලෙස ලිපි ද්‍රව්‍ය යටතේ ගිණුම්ගත කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ වත්කම් සහ අතිරික්තයේ වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල් ශේෂය රු.292,139,776 ක් වුවද සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය රු.292,153,541 ක් ලෙස ඉදිරියට ගෙන ඒම හේතුවෙන් රු.13,765 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනසට හේතු විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව හා ජාතික ලොතරැයි මණ්ඩලය විසින් කරන ලද තහවුරු කිරීම් අනුව 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ලොතරැයි ආදායම රු.289,368,951 ක් වුවද ගිණුමට අනුව ලැබිය යුතු ලොතරැයි ආදායම රු.289,347,951 ක් වූයෙන් රු.21,000 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙම වෙනසට හේතු වූ කරුණු සොයාබලා ගිණුම නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.3 නීති, රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම.**

පහත සඳහන් නීති, රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි යන ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල් පනත | |
| (i) 6 වන වගන්තිය. | පනතේ අරමුණු ඉටුකිරීම සඳහා සේවා නියුක්තිකයන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම හා සේවා නියුක්තිකයන්ගේ සුභසාධනය සඳහා විශිෂ්ඨ සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම යන අරමුණු දෙක සඳහා අරමුණු නිර්වචනය කර නිර්ණායක තීරණය කර නොතිබුණි. |
| (ii) 21 වගන්තිය | මෙම අරමුදල හුදෙක්ම සේවා නියුක්තිකයන්ගේ සුභසාධනය, ප්‍රවර්ධනය, ඔවුනට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම සහ ත්‍යාග පිරිනැමීම සඳහා පමණක් ස්ථාපිත කර තිබුණද එයට පටහැනිව සේවා |

නියුක්තිකයන්ගේ යැපෙන්නන් හා අනෙකුත් අනුශාංගික පාර්ශවයන්ගේ සුභසාධනය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.4,532,846 ක් වියදම් කර තිබුණු අතර මෙය සමස්ථ අරමුණු ඉටුකර ගැනීමේ වියදමින් සියයට 23.64 ක් විය.

(iii) 10(ඇ) වගන්තිය

ශ්‍රම වාසනා ලොතරැයි පැවැත්වීමෙන් ලැබෙන දායකය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් අරමුදලට ලැබිය යුතු වුවත් 2008 ඔක්තෝබර් මාසයෙන් පසුව එම ආදායම ලබා නොගැනීම නිසා 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආදායම රු.289,347,951 ක් වී තිබුණි.

(iv) (7)(2)(ඌ) වගන්තිය

ලැබිය යුතු ලොතරැයි දායකය අරමුදලට නොලැබීම නිසා වාර්ෂික අතිරික්තය මණ්ඩලයේ අභිමතය පරිදි ආයෝජනය කර ආදායම උපයා ගැනීමට නොහැකි වී තිබුණු අතර අරමුදලේ වියදම් දැරීමට මුදල් නොමැතිවීම හේතුවෙන් කල් පිරුණු ස්ථාවර තැන්පත් නැවත ආයෝජනය කර නොතිබුණි.

(v) 13(1),(2),(3) වගන්ති

එක් එක් වර්ෂයේදී මුද්‍රණය කළයුතු ලොතරැයි වර්ගය ලොතරැයි සංඛ්‍යාව, ලොතරැයි පැවැත්විය යුතු ආකාරය, ප්‍රදානය කරන තෑගි හා හිමිකම් නොකී තෑගි සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය පිළිබඳව සහ ඒ ඒ ලොතරැයියේදි ප්‍රදානය කළයුතු තෑගිවල වටිනාකමද ඇතුළුව ඒ ඒ ලොතරැයිය පැවැත්වීමේ වියදම පිළිබඳව ලොතරැයි මණ්ඩලය හා ශ්‍රම වාසනා අරමුදල අතර එකඟතාවයකට පැමිණ නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.39,281,320 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.57,537,862 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.18,256,542 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. ලොතරැයි අලෙවියෙන් ලද දායකය රු.3,648,670 කින්ද, ආයෝජන හා වෙනත් ආදායම් රු.3,091,317 කින්ද පහත වැටීම සහ අරමුදල පවත්වාගෙන යාමේ වියදම රු. 2,743,742 කින්ද අරමුණු ඉටුකර ගැනීමේ වියදම රු. 8,772,813 කින්ද වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අරමුණු ඉටුකර ගැනීමේ වියදම සමස්ත ආදායමෙන් සියයට 30 ක් පමණ සුළු ප්‍රතිශතයක් ගෙන තිබූ අතර පනතේ අරමුණු ඉටුකර ගැනීම සඳහා වූ ව්‍යාපෘතීන් හඳුන්වාදීම, සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම විධිමත් පරිදි සිදු නොකිරීම හේතුවෙන් මෙම වියදම අඩු අගයක් ගෙන ඇති බව නිරීක්ෂණය කෙරේ.

(ආ) සමාලෝචිත වර්ෂයේ අතිරික්තය සමස්ථ ආදායමෙන් සියයට 60 ක් පමණ ඉහළ අගයක් ගෙන තිබුණි. මෙම අරමුදල පිහිටුවීමෙන් පනතේ අරමුණු ඉටුකර ගැනීමට ප්‍රමාණවත් මුදලක් යොදවා නොතිබූ අතර අතිරික්තය ආයෝජනය කර ප්‍රතිලාභ අත්කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය සඳහා අරමුදල විසින් විගණනයට ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරි සැලැස්ම හා ප්‍රගති වාර්තා පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(අ) ක්‍රියාකාරි සැලැස්ම මගින් වර්ෂය තුළ ඉලක්ක පිහිටුවා තිබූ නමුත් වර්ෂය තුළ ක්‍රියාත්මක නොකළ වැඩසටහන් .**

සමාලෝචිත වර්ෂයේදී ඉටුකර ගැනීමට අපේක්ෂා කළ රු.මිලියන 31.95 ක ඉලක්කයන්ගෙන් පහත පරිදි වූ රු.මිලියන 5.9 ක් හෙවත් සියයට 19 ක් සම්පූර්ණයෙන් ඉටුකර ගෙන නොතිබුණි.

| | අරමුණ | වර්ෂයට අදාල ඉලක්ක | |
|---|---|---|---|
| | | ප්‍රමාණය | වටිනාකම (රු.මිලියන) |
| (i) | සේවා නියුක්තිකයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම් දීමකින් තොරව වසා දැමූ අවස්ථාවක, එම සේවා නියුක්තිකයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම පිළිබඳ කාර්මික අධ්‍යාපන වැඩසටහන් | 30 | 0.9 |
| (ii) | සේවා නියුක්තිකයන්ගේ සුභසාධනය සඳහා විශිෂ්ඨ සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීමේ අරමුණ යටතේ ත්‍යාග පිරිනැමීමේ වැඩසටහන් | 50 | 1.5 |
| (iii) | හදිසි අවස්ථාවලදී සේවා නියුක්තිකයන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීමේ වෛද්‍ය ආරක්ෂක වැඩසටහන් | 20 | 1.0 |
| (iv) | ශ්‍රම වාසනා අරමුදල සඳහා ISO ජාත්‍යන්තර තත්ත්ව සහතිකය ලබා ගැනීම. | 01 | 0.6 |
| (v) | අරමුදල සඳහා පරිගණක දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීමේ පළමු අදියර ක්‍රියාත්මක කිරීම. | 01 | 1.9 |

(ආ) පහත සඳහන් අරමුණු ඉටුකර නොගැනීමේ ප්‍රතිශතය සියයට 7 සිට සියයට 68 දක්වා පරාසයක පැවති බව නිරීක්ෂණය කෙරේ.

| | අරමුණ | වැඩසටහන | ඉටුකර නොගැනීම ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| (i) | සේවා නියුක්තිකයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විට ඔවුන්ට තාවකාලික ආධාර සැපයීම. | දිරිගැන්වීමේ වැඩසටහන් | 68 |
| (ii) | ව්‍යවසන අවස්ථාවලදී සේවා නියුක්තිකයන්ට/ යැපෙන්නන්ට මූල්‍යමය/වෙනත් ආධාර සැපයීම. | නීති ආධාර වැඩසටහන් | 40 |
| (iii) | සේවක සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම | ශිෂ්‍යත්ව වැඩසටහන් | 25 |
| (iv) | ආයතනය ශක්තිමත් කිරීම. | දැන්වීම් | 10 |
| (v) | අරමුදල ප්‍රවර්ධනය හා ප්‍රචාරණය. | පුහුණු වැඩසටහන් | 07 |

(ඇ) අරමුදලේ ඉලක්කගත අරමුණු සඵලදායි ලෙස ඉටුකර ගැනීමේ පරමාර්ථයෙන් සහකාර කළමනාකරණ නිලධාරියෙක් සහ කළමනාකරණ සහකාරවරුන් තිදෙනෙක් ආයතනයට බඳවාගෙන අදාල රාජකාරී පවරා තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාපිත කළ ඉහත (අ) සහ (ආ) හි සඳහන් ඉලක්ක කරා ලඟා වීමට නොහැකි වීමෙන් ගම්‍ය වන්නේ එම කාර්ය මණ්ඩලය බඳවාගැනීමේ පරමාර්ථය ඉටු වී නොමැති බවයි. තවද සමාලෝචිත වර්ෂයේ කාර්ය මණ්ඩල වියදම පෙර වසරට සාපේක්ෂව රු.1,822,816 ක් හෙවත් සියයට 82 කින් වැඩි වී ඇති බවද තවදුරටත් නිරීක්ෂණය කෙරේ.

## 4.2 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී නීති ආධාර යෝජනා ක්‍රමය ප්‍රචාරණය කිරීම සඳහා පුවත්පත් දැන්වීම් පළකිරීමට රු.175,997 ක් වැය කර තිබූ අතර සේවකයන් 09 දෙනෙකු සඳහා රු.75,000 ක නීති ආධාර ලබා දී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියෙන් ලබා දුන් ප්‍රතිලාභ ප්‍රමාණයට වඩා සියයට 234 ක් අදාල ප්‍රචාරණ දැන්වීමට වැයකර තිබුණි.

(ආ) පනතේ අරමුණු ඉටුකර ගැනීම සඳහා හඳුන්වා දී ඇති සේවා නියුක්තිකයන්ගේ වෘත්තීය පුහුණු යෝජනා ක්‍රමය, නීති ආධාර යෝජනා ක්‍රමය, ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය, ආපදා සහන යෝජනා ක්‍රමය ආදී වැඩසටහන් පිළිබඳව සැකසුනු දැන්වීම් පත්‍රිකා, අත්පොත්, ප්‍රචාරණ දැන්වීම් ආදිය මුද්‍රණය කර දිවයින පුරා පිහිටි දිස්ත්‍රික් කම්කරු කාර්යාලවල කම්කරු නිලධාරීන් මගින් අදාළ සේවා නියුක්තිකයන් වෙත බෙදාහැරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවධානය යොමුකර නොතිබුණු අතර සවිස්තරාත්මක දැන්වීම් ප්‍රචාරණ වැඩසටහන් ඔස්සේ අරමුදලේ යෝජනා ක්‍රමවල අරමුණු සම්බන්ධයෙන් සේවා නියුක්තිකයන් දැනුවත් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) 2014 නොවැම්බර් 21 දිනැති අංක 05/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව ලාභ උපයාගෙන ඇති රජය සතු ආයතන වෙත ප්‍රසාද ගෙවීම් අනුමත කර තිබුණි. එහෙත් ශ්‍රම වාසනා ලොතරැයිය පැවැත්වීමෙන් ලැබෙන දායකය වියදම් නොකිරීම හේතුවෙන් ශ්‍රම

වාසනා අරමුදලේ අතිරික්තය උද්ගතව තිබියදී සමාලෝචිත වර්ෂය සඳහා කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනා ලෙස රු.119,507 ක් ගෙවා තිබුණි.

(ඇ) අරමුදල ප්‍රවර්ධනය හා ප්‍රචාරණ වියදම් වශයෙන් රු.3,371,119 ක් සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබුණු අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 261 කින් වර්ධනය වීමකි. ආයතනය පිහිටුවීමේ මූලික අරමුණු ප්‍රවර්ධනය කර ගැනීම උදෙසා වූ ප්‍රවර්ධන හා ප්‍රචාරණ වියදම් මීට ඇතුලත් විය යුතු වූවද, විවිධ සමරු කලාප සඳහා ලබාදුන් මුදල් වලින් මෙම වියදම සකස් වී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2007 ඔක්තෝබර් 02 දිනැති අංක පීඊඩී 45 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරෙන බවට වූ වගන්තිය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලයේ ආවරණ අනුමැතියට යටත්ව විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

### 5.2 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නොපැවැත්වීම

පනතේ අරමුණු ක්‍රියාවට නැංවීම පිණිස අවශ්‍ය වන්නා වූ හෝ අනුශාංගික වන්නා වූ සියළුම දේ අරමුදලේ නමින් කිරීමට බලාත්මක අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලයේ පත්වීම් කාලය වලංගුව තිබුණද 2014 නොවැම්බර් 12 දින සිට රැස්වීම් පවත්වා අවශ්‍ය කටයුතු කර නොතිබූ අතර මේ හේතුවෙන් අරමුදලේ සියළු කටයුතු මන්දගාමී වී තිබුණි.

### 5.3 අභ්‍යන්තර විගණනය

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය මගින් නිකුත් කර ඇති අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශයේ 09 ඡේදය ප්‍රකාරව සෑම අභ්‍යන්තර විගණන ඒකකයක් විසින්ම නියමිත වාර්තා පිළියෙල කර ඉදිරිපත් කළ යුතු බවට උපදෙස් දී ඇත. මේ සඳහා වාර්ෂික අභ්‍යන්තර විගණන වැඩසටහනට අනුව නිකුත් කරන ලද විගණන නිරීක්ෂණ පාදක කරගත යුතු බවද පෙන්වා දී ඇත. නමුත් ශ්‍රම වාසනා අරමුදලට අදාළව ඉහත සඳහන් කිසිදු විගණන නිරීක්ෂණයක් හෝ කාර්තු වාර්තාවක් හෝ සාරාංශ වාර්තාවක් පිළියෙල කර ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය විය.

### 5.4 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත හා තථ්‍ය වියදම අතර විචලනය සියයට 14 සිට සියයට 90 දක්වා පරාසයක් ගෙන තිබුණු අතර අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය.
(ආ) අයවැය ලේඛනමය පාලනය.
(ඇ) අරමුදල් කළමනාකරණය.
(ඈ) අභ්‍යන්තර විගණනය.
(ඉ) කාර්යසාධනය .